# Living the Lotus



11
2022
VOL. 206

*Buddhism in Everyday Life*

*Founder's Reflections*

## තම ශක්තියෙන් පමණක් කල හැක්කක් නොමැත

වයස අවුරුදු 90 ක් වන මාගේ උපන්දිනය ඔබ සැම දෙනාම එක්ව සැමරීම තුලින්, යලිත් මගේ මතකයට නැගුණේ, 'තමාගේ ශක්තියක් නොමැත' යන වදනයි.

මේ යුගයේදීත්, මම මේ රටේ ජීවත්ව සිටින්නේ, ගණන් කල නොහැකි තරම් විශාල පිරිසකගේ හමුවීම් තුලින් ලැබුණු ශක්තිය නිසායි.

එය මිනිසුන්ට පමණක් සීමා නොවේ. අපි අවට තිබෙන්නා වූ සැම සියළු දෙයක්ම අපගේ පැවැත්මට දායක වේ. එසේ මේ සැම සියළු දෙයකම ආශිර්වාදයෙන් සැම දිනකම ජීවත් වීමට හැකි වී තිබෙනවා යැයි සිතූ විට, හමුවන සැම පුද්ගලයෙකුටම, අප අවට තිබෙන්නා වූ සැම දෙයකටම ගෞරව කරමින් ස්තූතිවන්ත නොවී සිටීමට නොහැකි වේ.

මම කුඩා කාලයේ සීයාගේ ඔඩොක්කුවේ නැලවෙමින් සිටින විට, 'ශිකා රටට, ලෝකයට වැඩදායී පුද්ගලයකු බවට පත්වෙන්න' යැයි සීයා පැවසූ වදන්, වයසට යන්න යන්න තව තවත් අරුත්බර වනවා යැයි සිතේ. එවකට එතරම් නොමේරූ මම, එම වචන වල තේරුම ඇත්තටම දැනගෙන සිටියෙ නැහැ. නමුත් සීයා එය නැවත නැවත පවසනවා ඇසෙන විට, එම වදන් ශරීරයට බද්ධ වී නොදැනුවත්වම එය මගේ ජීවිතයේ දිශානතිය සම්පූර්ණයෙන්ම වෙනස්කලා යැයි මා සිතනවා.හදවතින්ම 'කෘතවේදී යැයි සිතීමට හැකිවීවම, කොතරම් සතුට ගෙනදෙන කාරණයක්ද?.......... දෝගෙන්සෙන්ජි යතිවරයානන් දේශනා කල 'ධර්මය තුලින් තමාව අවබෝධ කරගැනීමයි' නිසකවම කල හැක්කේ එපමණයි.

නිර්මාතෘ සංකල්පනා ග්‍රන්ථය ඇසුරිනි. 10, P. 292-293

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍ර ධානීතුමාගේ මුලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සැම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus
Vol. 206 (November 2022)

Senior Editor: Keiichi Akagawa
Editor: Jigjidkhorloo Gereltuya
Copy Editors: Ruklanthi Palipana, Sahan Chamara, Rajitha Madurangha

*Living the Lotus* is published monthly by Rissho Kosei-kai International, Fumon Media Center, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# සියළු දෙනාගේ සතුට ප්‍රාර්ථනා කරන හදවත - ප්‍රඥව 2

රිෂ්ෂෝ කෝසෙයිකායි සංවිධානයේ සභාපති
නිචිකෝ නිවානෝතුමා



## 'ශුන්‍යතාවය' ග්‍රහණය කරගැනීම.

නව කතා කතුවරයකු වන හිසෂි ඉනොඋවේ මහතා, 'කිරීමට අපහසු දේ මෘදු මොළොක්ව, මෘදු මොළොක් දේ ගැඹුරින්, ගැඹුරු දේ රසවත්ව, රසවත් දේ අවංකව නිවැරදිව' යැයි ප්‍රකාශ කර තිබේ. එය බොහෝ දෙනෙකුට තේරුම් ගැනීමට පහසු වන ලෙස ස්වයංව සිතමින් ලියා තිබුණද, බෞද්ධ චින්තනය තරම් 'මෘදු මොළොක්ව, ගැඹුරින් මෙන්ම රසවත්ව' ප්‍රකාශ කිරීමට අපහසු දෙයක් තව නැතැයි මා සිතමි.

එයට උදහරණයක් ලෙස 'ශුන්‍යතාව' දැක්විය හැකිය. මේ ලෝකය තුල ස්ථාවරයි, නියතයි යැයි කිව හැකි කිසිම දෙයක් නොමැත. මෙම භෞතික ලෝකයේ සැරිසරන හො පවත්නා සෑම සියළු දෙයක්ම හෝ සිදුවීමක්ම එකිනෙකට සහ සම්බන්ධව පවතින අතර, 'බැදීම්' තුලින් තාවකාලිකව ගොඩනැගී තිබෙන 'ශුන්‍යතා ධර්මය' සය පාරමිතා තුල තිබෙන 'ප්‍රඥව' ලබා ගැනීමේ එක්තරා ඉගියක් බව පසුගිය මාසයේදී මම ප්‍රකාශ කලා. එසේනම් අපි මේ 'ශුන්‍යතාව' ග්‍රහණය කර, එදිනෙද ජීවිතය තුල භාවිතා කරන්නේනම් ප්‍රඥව ලබා ගැනීමට එය හේතු වේ.

ලේඛකයෙකු වන සෙයිකෙන් කොබයෂි මහතා 'හෘද සූත්‍රය' නම් පොත මූලික කරගෙන 'ශුන්‍යතාවය යනු හිස්බව යන අර්ථයට වඩා, නැත යන අර්ථයට වඩා 'චරිත නිරූපණය නොකරන'' යන අර්ථය බව පහද දෙයි. මේ ලෝකයේ සතුටුදයක සංසිද්ධීන් සහ අසතුටුදයක සංසිද්ධීන් නොතිබෙන අතර, 'එය අපේ හදවතේ හටගන්නා සිතුවිල්ලක්' පමණි. විවිධ සංසිද්ධීන් දෙස තමාට අවශ්‍ය ලෙස ආත්මාර්ථකාමීව 'චරිත නිරූපණය කරමින්' 'කළු,සුදු' යැයි බෙද වෙන්කරමින් කටයුතු කරන නිසා, එය දුකක් සේම දුක හටගන්නා බීජය බවට පත්වේ. එම නිසා අපි එවන් චරිතාංග නිරූපණය නොකර ඇති සැටියෙන් දේවල් පිළිගෙන කටයුතු කලයුතුයි. ඒ ආකාරයට කටයුතු කරන්නේනම් ජීවිතය සැහැල්ලුවෙන් ගත කිරීමට හැකිවීම 'ශුන්‍යතාව' තුලින් කියා දෙන්නාවු ප්‍රඥව යැයි කිව හැකිය.

එසේම බෞද්ධ දර්ශනිකයකු වන හිරෝ සචියා මහතා, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල කියාදෙන විවිධ ධර්මතාවල අර්ථය තේරුම් ගැනීමට පහසු ආකාරයට මේ 'විශ්වය තුල පවතින දේවල් අතරින්, වැඩකට නැතැයි සිතා බැහැර කල හැකි කිසිවක් නොමැත' යැයි පවසමින් එය 'ශුන්‍යතා' ධර්මයට සමානව දේවල් දෙස බැලීම බව පවසයි. එසේ නමුත් අපි 'මකුළුවන් වැනි කෘමීන් අහිතකර අවලස්සන සතුන් ලෙසත්, සමනලයන් ලස්සන හිතකර කෘමීන් ලෙසත්, බෙදවෙන් කරයි' එසේ බෙද

වෙන් කිරීම නොකල යුත්තක් වුවද අපි එසේ කරමින් සිටියි. එවැනි වෙනස්කම් වල තිබීමට අවශ්‍ය වෙනස්කම් ‘ප්‍රඥාවෙන්’ යුතුව සිතා හදුනාගනිමින්, සෑම සියලු දෙයක් තුලම බුදුන් වහන්සේගේ බුද්ධ ශක්තිය ඇති බව හිතේ ධාරණය කරගෙන, ‘අපි අකමැති පුද්ගලයා තුලත්, කමැති පුද්ගලයා තුලත් බුද්ධ ශක්තිය තිබෙනවා’ යන දෘෂ්ටි කෝණයෙන් බලන විට සෑම කෙනෙක් සමගම සමගියෙන් සතුටින් ජීවත් වීමට හැකිවීම ප්‍රඥාවනම් වේ.

.

## ප්‍රඥාවේ සය ආකාරයන්

මේ ලෝකය තුල පවතින සෑම සියළු දෙයක්ම ‘ශූන්‍යතාවයකින්’ හිස් බවකින් යුක්ත වන අතර, ඒ සෑම දෙයක් තුලම ‘බුදුන් වහන්සේගේ බුද්ධ ශක්තිය ගැබ්ව තිබේ’ එනම් ‘ සෑම කෙනෙකුම සමානාත්මතාවයෙන් යුතුයි යන දෘෂ්ටි කෝණය’ සහ ‘යථාර්තය හොදින් වෙන්කර හදුනාගෙන එකිනෙකාට ගෞරව කරමින් කරයුතු කිරීම යන දෘෂ්ටි කෝණය’ යන දෙකම ඉතාමත් වැදගත් බව පෙන්වාදෙයි. එය ‘ප්‍රඥාව’ යනුවෙන් හදුන්වයි. ඕනෑම දෙයක් දෙස ආත්මාර්ථකාමීව නොසිතමින්, මිනිසුන් ගැනත් දේවල් ගැනත්, එය පවතින ආකාරයෙන්ම (යථාරූපී ස්භාවය) පිළිගෙන ගෞරව කරමින් කටයුතු කිරීම, විනිශ්චය කිරීමට, අප තුල ප්‍රඥාව තිබේ.

කෙසේ නමුත්, මේ වසරේ 800 වන ජන්ම දිනය සැමරූ නිචිරෙන් යතිවරයාණන්, මේ විශ්වයේ සෑම දෙයක්ම ආශ්චර්‍යමත් ධර්මතාවයන් බව පවසයි. මෙයද ප්‍රඥාව පිළිබඳ වැදගත් කරුණකි. සෑම සියළු දෙනෙක්ම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සරණ යාම ප්‍රාර්ථනා කිරිම යන අර්ථයෙන්, මේ සෑම දෙයක්ම පවතිනුයේ සද්ධර්ම පුණ්ඩරීක දහමට අනුකූලව යැයි පවසන බැවින්, සෑම සියළු දෙනෙක්ම එකිනෙකට සහ සම්බන්ධ කරන සෑම දෙනාගේම සතුට ප්‍රාර්ථනා කරන ප්‍රාර්ථනයන් මේ සූත්‍රය තුල තිබෙන වචන තුල ගැබ්ව තිබේ.

‘තමාගේ සතුට ප්‍රාර්ථනා කරන්නේනම්, ප්‍රථමයෙන්ම තම අවට සිටින අය සහ ලෝක වාසී සියළු දෙනාගේ සාමය ප්‍රාර්ථනා  කරන්න’ යැයි නිචිරෙන් යතිවරයාණන්ද ප්‍රකාශ කලේ, ප්‍රඥාවන්ත දෑසින් අපි දේවල් දෙස බලන්නේනම් ඒ පුද්ගලයාත් මේ පුද්ගලයාත් ඉතාමත් වැදගත් යැයි සිතමින් සෑම සියළු දෙනෙකුගේම සතුට ප්‍රාර්ථනා කරමින් කටයුතු කරන්නේනම්, කරුණාවන්ත හදවතක් ඔබ තුල නිර්මාණය වේ. ඒ තුලින් ඔබට නිරතුරුවම පරාර්ථකාමීව කටයුතු කිරීමට හැකිවනු ඇත.

මෙහිදී මම, ප්‍රඥාව අන්තර්ගත වන සය පාරමිතාවන්ද, කරුණාව, දයාව සය ආකාරයකට බෙද පහද දී තිබේ යැයි සිතමි. දනමය පරිත්‍යාගයන්ද ඒ තුල අන්තර්ගත වන අතර, ‘පන්සිල් පද ආරක්ෂා කරමින්, ඉවසීමෙන් කටයුතු කිරීමෙන්, හදවත පාලනය කරමින්, සෑම දිනකටම හදවතින් ස්තූතිවන්ත වෙමින් කටයුතු කිරීම වේ. එසේ කටයුතු කිරීම අන් අය ගැන සිතන ඔවුන්ගේ සතුට ප්‍රාර්ථනා කරන පරාර්ථකාමීව ධර්මය පුරුදු පුහුණු කිරිම මගින් නිරායාසයෙන්ම තමාව ආලෝකයක් කර ගනිමින් අපිට ධර්මානුකූලව ජීවිතය ගත කිරීමට හැකිවනු ඇත.

From *Kosei*, November 2022.

# නව හදවතක ආරම්භය

බංගලාදේශ ධර්ම ශාඛාව
සුමොන් බරුවා මහතා

මෙම සෙප්පෝව, 2022 අවුරුද්දේ 02 වන මස 08 වන දින ඔන්ලයින් හරහා පැවැත්වූ 'දකුණු ආසියානු කාර්යමණ්ඩල උපදේශන වැඩසටහනේදී' ඉදිරිපත්කරන ලද්දකි.

අද දින දකුණු ආසියානු කාර්යමණ්ඩල උපදේශන වැඩසටහන තුලදී සෙප්පෝව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන හදවතින්ම ස්තුතිවන්ත වෙමි. මගේ නම සුමොන් බරුවා. මේ වන විට මා මගේ බිරිඳ දරුවා සහ මව සමග සතුටින් ජීවිතය ගත කරමින් සිටිනවා. ඇත්තටම මෙවර මට සතුටුදයක පුවතක් කියන්න තියනවා. එනම්, මාර්තු අගදී මගේ පවුලට නව සාමාජිකයෙක්, මගේ දෙවන දරුවා උපත ලබනවා. එනිසා අපි පවුලේ හැමෝම ගොඩක් සතුටින් බලා සිටිනවා.

මේ වන විට මා ධර්ම ශාඛාවේ ධර්ම නායකයෙකු ලෙස වැදගත් කාර්යභාරයක් සිදු කරමින් සිටිනවා. 2003 අවුරුද්දේ මා පළමු වරට ජපානයට පා තැබුවේ ගකුරින් අධ්‍යපනය ලැබීම සදහාය. ගකුරින් අධ්‍යාපනය අවසන් කර දැනට අවුරුදු 17 ක් ගත වන නමුත් එහි සිදුවීම් අද ඊයේ සිදු උනාක් මෙන් මතකයි. නරිතා ගුවන්තොටුපළේ සිට එකල පාසල පිහිටි ස්ථානය වෙත වාහනයෙන් ගමන් කරන අතරතුර ඇති සකුරා මල් වල සුන්දරත්වය විදිමින් ගමන් කල මා ෂින්ජුකු හි අහස උසට ඇති අතිවිශාල ගොඩනැගිලි දැක පුදුමයට පත් වුනා. ජපානය හොද සංවර්ධිත රටක්නේ කියා සිතුනා. ඒත් සමගම ජපානයේදී මගේ උපරිම කැපවීමෙන් කටයුතු කරනවා කියා මම මටම පොරොන්දු වූවා.

කෙසේ වෙතත්, ඉගෙනීමට හොද ආරම්භයක් ගත්තා වුවත් ගකුරින් ජීවිතය ඉතා දුෂ්කර බව ටිකෙන් ටික වැටහුණා. ගකුරින්හි දැඩි නීති පනවා තිබුණා. ජපන් සංස්කෘතිය මට නුහුරු නිසා මාව අවුල් වුනා. ජපන් භාෂාව ඉගෙන ගැනීමත් අමාරු වුණා. ජපන් භාෂා පාසලට ගොස් පාසල අවසන් වූ පසු මාගේ මිතුරන් තම නිවෙස් බලා ගියත් මට යාමට නොහැකි වූවා. මට අමතර පන්ති වලට සහභාගී වීමට සිදු වුනා. එසේ වුවත් ජපන් භාෂා පාසලේ ගුරුවරුන්ගේත් ගකුරින් පාසලේ ගුරුවරුන්ගේ සහ මිතුරන්ගේත් සහයෝගයෙන් මට, අවසානය දක්වාම ජපන් භාෂාව ඉගෙන ගැනීමට හැකි වුනා. ඒ හැමකෙනෙකුටම හදවතින්ම ස්තූතිවන්ත වෙමි.

මෙතන ඉදන් මා මගේ මෙතෙක් ජීවිතය තුල ඉගෙන ගත් දේ ගැන කතා කරන්න කැමතියි.

1993 දී මා කනිෂ්ඨ පාසලේ තුන්වන වසරේ (08 වන ශ්‍රේණියේ) ඉගෙනුම ලබමින් සිටින අතර තුරදී මට මගේ පියා අහිමි වුනා. එතැන් සිට මට ජීවිතයේ බොහෝ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු වුනා. තාත්තානැති දුප්පත් පුංචි කොල්ලෙක්ව සිටි කාලයේ තුන්වේලම කන්න ලැබෙනවානම් මොනතරම් සතුටක්ද කියා සිතමින් සිටියා. කෙසේ නමුත් දැන් ඒ ගැන කල්පනා කරන විට, එම දුෂ්කර කාල පරාසය හාල් ඇටයක් කෙතරම් වටිනවාද යන්න ගැන ඉගැන්වූවා යැයි සිතෙනවා.

මම විශ්ව විද්‍යාලයේ ඉගෙනුම ලබන කාලයේ අධ්‍යාපන කටයුතු සහ ජීවත් වීමට අවශ්‍ය මුදල් සොයා ගැනිමට නිවෙස් වලට ගොස් උපකාරක පන්ති පැවැත්වීම වැනි අර්ධකාලීන රැකියා පහක් පමණ සිදු කලා. මගේ දෙමාපියන්ගේ නිවස ඉතා කුඩා නිසාත්, සහෝදර සහෝදරියන් 7 දෙනෙක් සිටි නිසාත්, රාත්‍රියට නිදගන්නේ කෙසේදැයි සිතන්ටද වූවා. ඒ වුනත් අම්මාගේ සහ සහෝදර සහෝදරියන්ගේ ආශිර්වාදයෙන් කිසිම කරදරයක් නොමැතිව විශ්ව විද්‍යාල අධ්‍යාපනය අවසන් කිරීමට හැනි වුනා.

2009 අවුරුද්දේ දෙසැම්බර් මස 7 වන දින මා විවාහ වුනා. ඒ වන විටත් මා කෝසෙයිකායි ජාත්‍යන්තර මූලස්ථානයට අනුයුක්තව බංගලාදේශ ධර්ම ශාඛාවේ රාජකාරී කරමින් සිටියද, ඒ වන විට විවාහයට සහ බිරිද සමග නව නිවසකට යාම සදහා ප්‍රමාණවත් තරම් මුදල් නොමැති වූවා. මාස්පතා ඉතුරු කල මුදල් බැංකුවක ස්ථාවර තැම්පතුවක් දමා තිබුනත් එය ලබාගැනීමට මාස දෙකක් ගත වූ නිසා අවශය වියදම් පියවා ගැනීමට මුදල් ණයට (හදිසි ණයක්) ගැනීම හැර වෙනත් විකල්පයක් තිබුනේ නෑ.



දකුණු ආසියානු කාර්යමණ්ඩල උපදේශන වැඩසටහන තුල සෙප්පෝව ඉදිරිපත කරන සුමොන් මහතා

එනිසා මම හොඳින්ම විශ්වාස කල මිතුරකුගෙන් (මම ඔහුව M මහතා ලෙස හඳුන්වන්නම්) මාස දෙකකට පමණ ණය මුදලක් ලබා ගන්න පුළුවන්ද යැයි විමසා සිටියා. එසේම මට ණයක් ලබාදුන් බව අන් කිසිවෙකුටත් නොපවසන ලෙසත් ඉල්ලා සිටියා. මගේ මිතුරාගෙන් මුදල් ණයට ගැනීම මට ලැජ්ජාබවක් මෙන්ම වරදකාරී හැඟීමක් වූවා. කෙසේ වෙතත් M මහතා මට මුදල් ණයට දුන් බව මාව හොඳින් දන්න මගේ වෙනත් මිතුරකුට පවසා තිබුණු අතර, ඔහු පැමිණ යාහළුවාගෙන් මුදල් ණයට ගන්න ලැජ්ජා නැද්ද කියා පවසමින් මට බැන වැදුනා. එය මට මහත් කම්පනයක් වූවා. ඒත් සමගම M මහතා මාගේ විශ්වාසය කඩකලා යැයි හැඟී මනස අවුල් වූ අතර මැරෙන්නට තරම් සිතුනා.

ඊට පසු දින, වෙනත් මිතුරකුගෙන් දුරකථන පණිවිඩයක් ලැබුනා. චිත්තගොම් සිට 150 KM පමණ දුරින් පිහිටි කොමිලා කියන නගරයේ පිහිටා ඇති ජපන් සමාගමක සේවයට පරිවර්තන කටයුතු සඳහා නව සේවකයකු සොයන බව ඔහු පැවසුවා. එහි මාසික වැටුප, ඒ වනවිට මා මාසිකව ලබාගන්නා මාසික දීමනාව මෙන් තුන්ගුණයක් පමණ වූවා. විවාහ වූ අලුත නිසා බිරිඳ ගැන සිතූ විට, 'හැකි ඉක්මනින් ණය මුදල ගෙවා අවසන් කර එදිනෙද ජීවිතය ස්ථාවර කරගත යුතුයි. ඒ සඳහා රිෂ්ෂෝ කෝසෙයිකායි හි රැකියාවෙන් ඉවත්ව වැඩි වැටුපක් ලැබෙන සමාගමේ රැකියාවට ගියානම් හොඳයි නේ...' කියා සිතමින් දෙගිඩියාවෙන් යුතුව කුමක් කරන්නේද කියා සිතාගත නොහැකිව රාත්‍රියේ නිදගැනීමට නොහැකිව දින කිහිපයක් ගතවූවා.

ඒ වෙලවේ මම ආස කරපු ජපන් ගීතයක් මගේ මතකයට ආවා. එය 'යුසු' ලෙස හඳුවන ජපන් ජාතික යුවලක් විසින් ගායනා කරන 'එයිකෝ නො කකෙහෂි (මහිමයේ පාලම)' ලෙස හඳුන්වනවා. තමන්ගේ කඳුළු අන් අයට නොපෙන්වමි, සිහින කිසිද අත්නොහරිමි කියන ශක්තිමත් හදවත ගැන ලියැවුණු ගී පද සිහියට නැගුණු විට, මට ධෛර්යක් දැනුනා. පසුව මා, ගීතයේ සඳහන් පරිදි මා හෙලනා කඳුළු කිසිවෙකුට නොපෙන්වමි කියා හදවතින් සිතා ගත්තා. ඒ වගේම කිසිවෙකුත් සමග කතාබහ නොකර එකතු කරගත් වේදනාවන් සහ වෛරී සිතුවිලි සියල්ල මා නැති කරගත යුතුයි කියා සිතුවා.

පසුව මා, මෙම ණය ප්‍රශ්නය තුලින් බුදුන් වහන්සේ මට කුමක් උගන්වනවා ඇත්දැයි යන්න ගැන හොඳින් කල්පනා කලා. එවිට, 'කෝසෙයිකායි සංවිධානය සමග සම්බන්ධ වී, වටිනා සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ගැන සහ නිර්මාතෘ තුමාගේ ඉගැන්වීම් ඉගෙන ගන්න වාසනාව ලැබුණා. ඊට අමතරව ගකුරින් පාසලේ අධ්‍යාපනය ලබන්නත් අවස්ථාව ලැබුණා. ඒ කෙසේ වෙතත් මම මුදල් ගැනම පමණක් සිතා ධර්මය සමග බැඳීම ඉවතලා වෙනත් රැකියාවකට යන්න සැරසුනු' මගේ හදවතේ වූ වැරදි වැටහීම ගැන අවබෝධ වූවා.

තමන් දෙස නැවත හැරී බැලූ විට මාගේ දුකට හේතුව මටම වැටහුනා. ඇත්තටම, මම දුකට පත්ව සිටින බව අන් අය, විශේෂයෙන් මාගේ වැඩිමහල් සොහොයුරා (දැනට කැනඩාවේ ජීවත් වන) දැනගැනීම අවශ්‍ය නැතැයි මා සිතා සිටියා. ඒ, මම හොඳින් සතුටින් ඉන්නවා යැයි අන් අයට පෙන්වීමට වුවමනා වූ නිසයි. නමුත් මම මගේ ලොකුකම පැත්තකට දමා ලැජ්ජාවෙන් වුවත්, මගේ අයියාට ණය ප්‍රශ්නය ගැන පැවසුවා. කීවගමන් ඔහු කිසිවක් නොකියා ණය ගෙවීමට උදවු කිරීමට ඉදිරිපත් වුනා. ඒත් සමගම ඔහු, 'ඉහල වැටුප් ලැබෙන රැකියා වලට යාමට ගොස් අතරමං නොවී කෝසෙයිකායි හි වැඩ කටයුතු නිසිලෙස ඉටුකරන්න කියා දැඩිව කියා සිටියා.

ජීවන වියදම අඩුකර ගැනීමට ටික කලක් දෙමාපියන් සමග ජීවත් වූවානම් හොඳයි කියා ඔහු යෝජන කලා. ඒ වෙලාවේ මට දැනුනේ, මගේ සහෝදරයා මාර්ගයෙන් බුදුන් වහන්සේ මට කතා කරනවාක් මෙන්ය. ඒත් සමගම නැවුම් වාත ධාරාවක් හදවත තුලින් යනවාක් මෙන් හැඟී මට මහත් සැහැල්ලුවක් දැනුනා.

මම මේ වනවිට, ඉතාමත් ප්‍රීතිමත් ජීවිතයක් ගත කරනවා. කෙසේ නමුත්, දෙමාපියන් සහ සහෝදරයන් මූලිකව, විශාල පුද්ගලයින් පිරිසකගේ සහයෝගය ආශිර්වාදය නොමැති වූවානම්, අද මේ වනවිට මා නොඉන්නට ඉඩ තිබුනා. හැම කෙනෙකුම මේ වනතෙක් මා වෙනුවෙන් බොහෝ ලෙස කඳුළු සලමින් කටයුතු කලා. ඒ කෙසේ නමුත් මෙතැන් සිට අන් අය වෙනුවෙන් හැකි උපරිමයෙන් කැපවෙමින් අන් අයගේ දුක බෙදාගනිමින් කටයුතු කලයුතුයි කියා සිතනවා. තවද, හැකිතරම් පිරිසකට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සහ නිර්මාතෘ තුමාගේ ඉගැන්වීම් කියාදීමට කටයුතු කරනවා. අවසානයට අප ධර්ම ශාඛාවේ කියෝකයිචෝ නගශිමා මහතා ඉගැන්වූ වචන කිහිපයක් ඔබ සමග බෙදගන්නට කැමතී. එනම්, 'අතීතය නිධානයක්, වර්තමානය කෘතඥතාව සහ උද්යෝගය, අනාගතය ආලෝකයක්' යන්නයි.

මෙය මා ගකුරින් අධ්‍යාපනය අවසන් කර දිගු කලකට පසු සිදුකල පළවන සෙප්පෝව. එයට සවන් දුන් හැමෝටම



බිරිඳ, වැඩිමහල් දියණිය සහ මාර්තු මස අලුත උපන් දරුවා සමග

# රිෂ්ෂෝ කෝසෙයි කායි හැඳින්වීම

## බුදුන් වහන්සේගේ ජීවිතය සහ බෞද්ධ ඉගැන්වීම්

### ලෝකයේ සෑම දෙයක්ම වෙනස් වෙමින් පවතී

'මිනිසුන්ගේ හදවත් සහ ලෝකයේ පවතින සෑම සියළු දෙයක්ම නිරන්තරයෙන් වෙනස්වේ' මෙය 'අනිත්‍ය බව' යනුවෙන් හඳුන්වයි.

අපි වැඩෙන විට, අපේ ශරීරය විශල වෙමින් බරද වැඩි වේ. මනෝභාවයද ඊයේ දින සහ අද ගත් ගත් විට වෙනස්ව පවති. අපි ආදරය කරන දේ කැඩී බිඳී යන අවස්ථාවන්ද තිබේ. එනිසා, දේවල් වලට නොඇලී සියල්ල වෙනස්වන බව වටහාගෙන ජීවත් වීම ඉතා වැදගත් වේ.

වෙනස්වන ලෝකයේ ඊට අනුරූපව යහපත් ලෙස තමන්ව වෙනස්කර ගනිමින් ජීවත්ම ගැන 'අනිත්‍ය' බව තුල උගන්වයි.







ඔබේ දැනුමට

බුදුදහමේ මූලික සංකල්ප තුනක් ලෙස 'අනිත්‍ය (සියල්ල වෙනස්වේ), අනාත්ම (සියල්ල එකිනෙකට සහ සම්බන්ධව පවතී), නිර්වාන ශාන්තිය (ඵලය)' යන කරුණු තුන ගැන විදහා දක්වයි. මෙම ධර්ම කරුණු තුන නිවැරදිව අවබෝධ කරගත් විට, දුකින් මිදිය හැකි බව බුදු දහම තුල උගන්වයි.

※කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.





## ලෝකයේ සැම සියළු දෙයක්ම එකිනෙකට සහ සම්බන්ධව පවතී




මේ ලෝකයේ සැම සියළු දෙයක්ම එකිනෙකට සහ සම්බන්ධව පවතී. අපට කිසිවක් තනිවම කල නොහැකිය. මෙය 'අනාත්ම' ලෙස හඳුන්වයි.

එළදෙනුන්, ඌරන්, එළවළු වගා කරන ගොවීන් සහ ඒවා විකුණන අය නොමැතිව හැමෝම ආස කරන හැම්බර්ගර් කන්නට අවස්ථාවක් නොලැබේ.

අපි මේ ලබා තිබෙන ජීවිතයට අපව බිහිකර ඇති දැඩි කලාට, දෙමාපියන්ට, ආච්චීට සීයාට අපි ණය ගැතියි.

අප කිසිදිනෙක තනිවම ජීවත් වන්නේ නැත එනිසා නිරන්තරයෙන් මිතුරන් සමග සුහදව කටයුතු කරමින් කෘතඥතාවය පල කරන්න.

**ඔබේ දැනුමට**

'කිසිවක් ඉබේම හටනොගනී', 'සැම සියළු දෙයක්ම තමා සිතන ආකාරයෙන්ම සිදු නොවේ' යන තේරුමෙන් යුතුව වස්තූන්ට නොඇලී ජීවත් වීමට උගන්වයි. එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට ඔබට හැකි වූ විට සාමකාමී තත්වයකට පත්විය හැකියැයි පවසයි. 'මෙය පරාර්ථකාමී ලෙස සිතීමද වේ.'

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212 FAX: 1-808-455-4633
Email: sangha@rkhawaii.org URL: https://rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1809 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: info@rk-la.org URL: https://www.rk-la.org

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
(Address) 1031 Valencia Way, Pacifica, CA 94044, USA
(Mail) POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 Email: lotusbuddhist@gmail.com
URL: https://sf-buddhism.org

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: https://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: rkchicago@rkchi.org URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
Email: rkftmyersbuddhism@gmail.com URL: https://rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
(Address) 2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
(Mail) POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: dharmacenter@rkok-dharmacenter.org
URL: https://rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago St. #809, Denver, CO 80204, USA
TEL: 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-269-4567
Email: info@rkina.org
URL: https://www.buddhistcenter-rkina.org

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692148, San Antonio, TX 78249, USA
TEL: 1-210-558-4430 FAX: 1-210-696-7745
Email: dharmasa@rksabuddhistcenter.org
URL: https://rksabuddhistcenter.org

**Rissho Kosei-kai of Seattle**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 Email: rkseattlewashington@gmail.com
URL: https://www.buddhistlearningcenter.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://rkk.org.br
Facebook: https://www.facebook.com/rishokosseikaidobrasil
Instagram: https://www.instagram.com/rkkbrasil

**在家佛教韓国立正佼成会　Korean Rissho Kosei-kai**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571　FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
**Korean Rissho Kosei-kai of Busan**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571　FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會　Rissho Kosei-kai of Taipei**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633　FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會　Rissho Kosei-kai of Tainan**
台湾台南市東區崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478　FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai Society of Kolkata**
89 Srirampur Road (VIP), Garia, Kolkata 700084, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya**
Ambedkar Nagar, West Police Line Road, Rampur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna**
Please contact Rissho Kosei-kai Society of Kolkata

**Rissho Kosei-kai of Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**Rissho Kosei-kai International of South Asia (RKISA)**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216　Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406　FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**
Please contact Rissho Kosei Dhamma Foundation

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL: 880-2-41360470

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Dhaka North**
Bashundhara R/A, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

Please contact Rissho Kosei-kai Bangladesh
**Rissho Kosei-kai Patiya**
**Rissho Kosei-kai Ramu**
**Rissho Kosei-kai Aburkhil**

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960　Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949　Email: roma@rk-euro.org

Please contact Rissho Kosei-kai di Roma
**Rissho Kosei-kai di Venezia**
**Rissho Kosei-kai of Paris**

**Rissho Kosei-kai of the UK**
29 Ashbourne Road, London W5 3ED, UK
TEL: 44-20-8933-3247　Email: info@rkuk.org　URL: https://www.rkuk.org
Facebook: https://www.facebook.com/rkuk.official
Twitter: https://twitter.com/rkuk_official
Instagram: https://www.instagram.com/rkuk_official
YouTube: ttps://www.youtube.com/c/rkuk_official

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC)**
〒 166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230　FAX: 03-5341-1224　URL: https://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**